# 7 තාවකාලික අංක තහඩුව ( කරිනම්බා ) ( *Kari Nanbā* )

「 පරීක්ෂණ පවත්වා නැති වාහන 」 සහ 「 ලියාපදිංචි කරනැති වාහන 」 මහාමාර්ගයේ පදිනවිට කරුණාකර තාවකාලික වාහන අංකයක තහඩුව ඉල්ලුම් කළයුතුයි.එවිට නගර සභාව විසින් ඒසඳහා වූ බලපත්‍රය සහ තාවකාලික අංක තහඩුවක් ලබාදෙනු ලැබේ.

## (1) තාවකාලික අංකය ( *Kari Nanbā* ) ඉල්ලුම් කරන ස්ථානය

නගරසභාවේ <මහජන සම්බන්ධතා අංශය ( *Shiminka* )> වෙත ගොස් ලබා ගතහැක.පහත සඳහන් දෑ රැගෙන එන්න

< නගරසභාවට යනවිට රැගෙන යායුතු දේ >

පහත සඳහන් ① සිට ⑤ දක්වා සහතික පත් සියල්ලම රැගෙන එන්න.

① වාහනයේ රක්ෂණ පත ( *Jibaiseki Hokenshō* ) ( පිටපතක් පාවිච්චි කල නොහැක. කාලසීමාව අවසන් වී ඇති ( *Yūkōkikan* ) රක්ෂණ සහතික පරිහරණය කල නොහැක. )

② පහත සඳහන් ලිපිද්‍රව්‍ය වලින් කුමක් හෝ රැගෙන එන්න.

- වාහනයයේ පරීක්ෂණ වාර්තාව ( *Jidōsha Kensashō* )
- වාහනයේ ලියාපදිංචිය මකාදැමූ බව සඳහන් සහතිකය ( *Masshō Tōroku Shōmeisho* )
- තෝරොකු ෂිකිබෙත්සු ජෝහෝතෝ ත්සූචි ෂො ( *Tōroku Shikibetsu Jyōhōtō Tsūchisho* )
- ජිදෝෂා කෙන්සෂෝ හෙන්නෝ ෂෝමෙයිෂො ( *Jidōsha Kensashō Hennō Shōmeisho* )
- අපනයන සහතිකය ( *Yushutsu Yotei Todokede Shōmeisho* )

③ සීල් එක < *Hanko* > ( සමාගමේ නමින් ඉල්ලුම් කිරීමේදී සමාගමේ සීල් එක අවශ්‍ය වේ. )

④ සිල් එක ලියාපදිංචි කිරීමට පැමිණීමේදී පහත සඳහන් දේවලින් කුමක්හෝ රැගෙන එන්න.

- රියදුරු බලපත්‍රය ( *Jidōsha Unten Menkyoshō* )
- ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැඳුනුම්පත ( *Zairyū Kādo* )
- ස්ථිර පදිංචිකරුවන්ගේ සහතිකය ( *Tokubetsu Eijūshashō* )

⑤ මුදල් යෙන් 750 ක්



## ( 2 ) තාවකාලික අංක තහඩුව ( *Kari Nanbā* ) පාවිච්චිකළ හැකි කාලසීමාව

තාවකාලික අංක තහඩුව ( *Kari Nanbā* ) ලබාගත් දිනයේ සිට දින 5 ක් ඇතුළත පරිහරණය කළහැකිය. තාවකාලික අංක තහඩුව පරිහරණය කර අවසන් වුන දිනයේ සිටදින 5 ක් ඇතුළත අනිවාර්යයෙන්ම නගරසභාවට ආපසු භාර දිය යුතුවේ. එවිට බලපත්‍රය සහ අංක තහඩුව රැගෙන එන්න.

※තාවකාලික අංක තහාඩුව ලබාගත නොහැකි අවස්ථා ද ඇත.වැඩි විස්තර සඳහා නගරසභාවේ < මහජන සම්භන්ධතා අංශය ( *Shiminka* ) > වෙත පැමිණෙන්න.




◎ 20 වුවේ අමාරු වචන ◎

※වාහනයේ රක්ෂණ පත ( *Jibaiseki Hokenshō* ) : වාහනය මිළදී ගත් පුද්ගලයා අනිවාර්යයෙන්ම ඇතුල්විය යුතු රක්ෂණ පත

※වාහනයයේ පරීක්ෂණ වාර්තාව ( *Jidōsha Kensashō* ) : වාහනය පරීක්ෂණයට භාජනය කරඇති බව සඳහන් කර ඇති ලියවිල්ල. මෙම සහතික පත නොමැතිව වාහනය පාරේ පැදවිය නොහැක.

※වාහනයේ ලියාපදිංචිය මකාදැමූ බව සඳහන් සහතිකය ( *Masshō Tōroku Shōmeisho* ) : වාහනය කඩා නොදමා විකුණන විට අවශ්‍ය වන ලියවිලි

※තෝරොකු ෂිකිබෙත්සු ජෝහෝතෝ ත්සූචි ෂො ( *Tōroku Shikibetsu Jōhōtō Tsūchisho* ) : එම වාහනය කඩා නොදමා විකුණන විට වාහනය හිමි කරුට ලැබෙන ලියවිලි

※ජිදෝෂා කෙන්සෂෝ හෙන්නෝ ෂෝමෙයි ෂො ( *Jidōsha Kensashō Hennō Shōmeisho* ) : එම වාහනය අයින් කලවිට ලැබෙන ලියවිල්ල

※අපනයන සහතිකය ( *Yushutsu Yotei Todokede Shōmeisho* ) : මෙම වාහනය වෙනත් රටකට විකිණීමේ දී භාවිතා කරන ලියවිල්ල

| ඉල්ලුම් කරන ස්ථානය | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| මහජන සම්භන්ධතා අංශය<br>( *Shiminka* ) | 296 බන්චි,තොනොදයි,සන්මුනගරය<br>( 296,Tonodai,Sammu-shi ) කවුළු අංක ① | 0475-80-1141 |

< විමසීම් කළ හැකි වේලාවන් > සඳුදා සිට සිකුරාදා දක්වා දිනයන්හිපෙරවරු8.30සිට පස්වරු5.00දක්වා

※ඉල්ලුම් කිරීමේදී මෙහි සිදුකෙරෙන කාර්යයන් සඳහා කාලය ගතවේ. වේලාසනින් නගරසභාවට පැමිණ ඉල්ලුම් කරන්න.

※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.